# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2008

## සමාජීය විද්‍යා පීඨය

මනෝ විද්‍යාව - PSYC -E1015

සාමාන්‍ය මනෝවිද්‍යාවට හැඳින්වීමක්

**<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න</u>**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි  කාලය : පැය 03 යි

---

01. "මනෝවිද්‍යාවේ විෂය ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය මිනිස් චර්යාවේ ස්වභාවය අනුව සකස් වී ඇත." සාකච්ඡා කරන්න.

02. මනෝවිද්‍යාව පෝෂණය කිරීමෙහි ලා විවිධ විෂය ක්ෂේත්‍ර දායක වූ ආකාරය (අවම වශයෙන් විෂය ක්ෂේත්‍ර 3 ක් ඇසුරෙන්) පැහැදිලි කරන්න.

03. ළමා මනෝවිද්‍යාව හා සංවර්ධන මනෝවිද්‍යාව අතර පවතින සමානතා පෙන්වා දෙමින් මෑත කාලයේදී සංවර්ධන මනෝවිද්‍යාවට සුවිශේෂ වැදගත්කමක් හිමිවීමේ හේතු පැහැදිලි කරන්න.

04. මනෝවිද්‍යාව විද්‍යාත්මක විෂයක් වශයෙන් සංවර්ධනය කිරීමෙහි ලා චර්යාවාදීන් වෙතින් ඉටු වූ සේවය විස්තර කරන්න.

05. ප්‍රජානන මනෝවිද්‍යාව විසින් මනෝවිද්‍යා විෂයෙහි කරනු ලැබූ විප්ලවය විස්තර කරමින් එමගින් සමාජ සංවර්ධනයට ලැබූ දායකත්වය පරීක්ෂා කරන්න.

06. සංදෘෂ්ටික මනෝවිද්‍යාවේ මූලික සංකල්ප විදහා පාමින් රචනාවක් ලියන්න.

07. "අමතක වීම බොහෝ විට සිදුවෙන්නේ කායික රෝගී තත්වයක් වශයෙන් නොව සාමාන්‍ය ජීවිතයේ දී මුහුණ දෙන්නට සිදු වන සමාජ මානසික ගැටළුවල ප්‍රතිඵලයක් වශයෙනි." මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නෙහි ද? හේතු දක්වන්න.

08. ළමයින්ගේ බුද්ධි සංවර්ධනය කෙරෙහි හේතු වන විවිධ සාධක උදාහරණ සමගින් විස්තර කරන්න.

09. කිසියම් සමාජයක මානසික සෞඛ්‍යය සංවර්ධනය කිරීමෙහි ලා දෛනික ජීවන ගැටළු විසඳීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

10. "ජීවිත සාර්ථකත්වය ලබාගැනීම සඳහා පුද්ගලයෙකු අභිප්‍රේරණය කිරීමේ හොඳම මාර්ගය ඔහුගේ හෝ ඇයගේ අනන්‍යතාව ඉස්මතු කිරීමට උදව් කිරීමයි." මේ පිළිබඳ ඔබේ අදහස පැහැදිලි කරන්න.

*****************************************